# මෙම සටහන
# ලියාගන්න

# ඇම්බැක්ක දේවාල කැටයම්

1



krd

## ඇම්බැක්කේ දේවාලය



**පිහිටීම/ස්ථානය** - මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රදේශයේ ඇම්බැක්ක ග්‍රාමයේ

**යුගය** - ගම්පොළ යුගය

**කාලය** - ක්‍රි.ව 14 වන සියවස

**රාජ්‍ය අනුග්‍රහය** - තුන් වැනි වික්‍රමබාහු රජු (ක්‍රි.ව 1357-1374)

**නිර්මාණ ශිල්පියා** - දෙල්මඩ මූලාචාරී

**මාධ්‍ය** - ගම්මාලු ලී

**කලා ලක්ෂණ** -

- මෙම දේවාලය කතරගම දෙවියන් උදෙසා කළ නිර්මාණයක් ලෙස සැලකේ.
- මෙය ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ එහි ඇති වාස්තු විද්‍යාත්මක අංග සහ ලී කැටයම් නිසා ය.
- ඇම්බැක්කේ දේවාලය වාහල්කඩ, මණ්ඩපය, දිග්ගෙය හා වැඩ සිටින මාලිගාව යන කොටස්වලින් යුක්තයි.
- **වාහල්කඩ** විහාර භූමියට ඇතුළු වීමේ ප්‍රධාන පිවිසුම වේ.
- **වාහල්කඩ** සතරැස් හැඩැති ගොඩනැගිල්ලක් වන අතර **දිග්ගෙය** සෘජු කෝණාස්‍රාකාර හැඩැති ය.
- වාහල්කඩ නිර්මාණය සඳහා ලී කණු දහයක් යොදා ඇති අතර එක් කණුවක සතරැස් පනේල හතරක් බැගින් එහි පනේල කැටයම් ගණන හතළිහක් වේ.
- දිග්ගෙය තුළ ඇති සම්පූර්ණ කුළුණු සංඛ්‍යාව තිස් දෙකකි. සෑම කුළුණක ම පනේල සතර ගණනේ සම්පූර්ණ පනේල ගණන එකසිය විසි අටකි.
- මෙම සියලු ම කණු සතරැස් හැඩයකින් හා අටැස් හැඩයකින් යුක්ත වේ.
- සෑම කණු අගම සතර පැත්තට යොදන ලද පේකඩ කැටයම් වේ.
- පේකඩ මත සවි කරන ලද තලාදවල ඇති යට ලී මත වහල නිර්මාණය කොට තිබේ.
- ඇම්බැක්කේ දේවාලයේ වහලෙහි යට ලීය සහ පරාල එකිනෙකට සම්බන්ධ කර ඇති සුවිශේෂ නිර්මාණය **මඬොල් කුරුපාව** නමින් හඳුන්වනු ලැබේ.
- මඬොල් කුරුපාව පරාල 26ක් සම්බන්ධ වන සේ එකට වද්දා තිබේ. මේ සඳහා ලී ඇණ භාවිත කර තිබේ.



**දිග්ගෙය**



**ලී කණු**



**මඬොල් කුරුපාව**

**ඇම්බැක්කේ කැටයම් නිර්මාණ ඇගයීම**

**නිදසුන් -1**



**තේමාව** - මල්ලවපොරය

**ස්ථානය** - ඇම්බැක්කේ දේවාලයේ දිග්ගෙයි පනේලවල

**කාලය හා යුගය** - 14 වන සියවස හා ගම්පොල යුගය

**රාජ්‍ය අනුග්‍රහය** - තුන් වැනි වික්‍රමබාහු රජු (ක්‍රි.ව 1357-1374)

**නිර්මාණ ශිල්පියා** - දෙල්මඩ මූලාචාරි

**මාධ්‍ය** - ගම්මාලු ලී

**ශිල්ප ක්‍රමය** - උන්නත

**ශෛලිය** - ශෛලිගත ලක්ෂණ

**කලා ලක්ෂණ** -

- රූප හා ඉරියව්වේ ශක්තිමත්බව වෙනුවට විද්මානුකූල ස්වභාවයක් දිස්වේ.
- ඇඳුම් පැළඳුම් ආභරණ, තොණ්ඩ මෝස්තරය සඳහා නම්‍ය වූ රේඛා භාවිත කොට ඇත.
- මානව රූපවල අංග කොටස් හා ඉරියව් ලී රාමුව මත සමබරව සංරචනය කර ඇත.
- මානව රූප මධ්‍ය කොට ලී රාමුව වටා අරිම්බු මෝස්තරය යොදා ඇත.

**නිදසුන් -2**



**තේමාව** - දරුවකුට කිරිපොවන මව

**ස්ථානය** - ඇම්බැක්කේ දේවාලයේ වහල්කඩ පනේලවල

**කාලය හා යුගය** - ක්‍රි.ව 14 වන සියවස හා ගම්පොල යුගය

**රාජ්‍ය අනුග්‍රහය** - තුන් වැනි වික්‍රමබාහු රජු (ක්‍රි.ව 1357-1374)

**නිර්මාණ ශිල්පියා** - දෙල්මඩ මූලාචාරි

**මාධ්‍ය** - ගම්මාලු ලී

**ශිල්ප ක්‍රමය** - උන්නත

**ශෛලිය** - ශෛලිගත ලක්ෂණ

**කලා ලක්ෂණ** -

- දරුවාට කිරිපොවන මව අසල සිටගත් තවත් දරුවකු සහිත රූප ත්‍රිත්වයක එකතුවකි.
- ඇඳුම් පැළඳුම් ආභරණ, තොණ්ඩ මෝස්තරය සඳහා නම්‍ය වූ රේඛා භාවිත කොට ඇත.
- මානව රූප ලී රාමුව මත සමබරතාව රැකෙන ලෙස සම්පිණ්ඩනය කර ඇත.
- මානව රූප මධ්‍ය කොට ලී රාමුව වටා කුන්දිරික්කන් මෝස්තරය යොදා ඇත.

**ඇම්බැක්ක දේවාලයට අයත් සුවිශේෂ කැටයම්**

**1. කල්පිත සත්ත්ව මෝස්තර :**


ගජසිංහ


හේරුණ්ඩ පක්ෂියා


වෘෂභ කුඤ්ජරය


සැරපෙන්දියා

**2. කල්පිත මිනිස් රූප**


සඳකිඳුරු


නාරිලතා

**3. මිනිස් රූප**


මල්ලව පොරය


රබන් වයන්නා


නළඟන


දරුවෙකුට කිරිපොවන මව


අශ්වාරෝහකයා


හේවායා

### 4. සත්ත්ව මෝස්තර



සිංහයා



හංසයා



හංස පූට්ටුව

### 5. මෝස්තර



ලියකම්







පේකඩවල නෙළුම් මල් කැටයම්

# කැටයම් නිර්මාණ සඳහා පාදක තේමා



| තේමා කාණ්ඩය | කැටයම |
|---|---|
| 1.කල්පිත සත්ත්ව මෝතර | හංස පූට්ටුව,ගේරුණ්ඩ පක්ෂියා, ඇත්කඳ ලිහිණියා,සැරපෙන්දියා නාරිලතා,කිඳුරා,වෘෂභ කුංකද්ජරය |
| 2.සත්ත්ව මෝස්තර | ගවයා, සිංහයා, ඇතා, හංසයා |
| 3.ජන ජීවිතය krd | අශ්වාරෝහකයා,රබන් වයන්නා, හේවායා,මල්ලව පොරය,නළගන, දරුවාට කිරි පොවන මව |
| 4.ලිස්තර | නිර්ජීවී මෝස්තර:අරිම්බුව,ගල්බිංදුව |
| 5.මල්කම් හා ලියකම් | නෙලුම් මල් හා ලියවැල් උද්භිද මෝස්තර |